## දරුවන් උදෙසා බයිබලයක්

# දෙවියන් වහන්සේ ජෝසෙප් නම් වහලා උසස් කරන සේක



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජෝසෙප්, ඔහුගේ කළින් ස්වාමියා
වූ පොතිපර් විසින් තමුන් නොකළ
වරදකට සිරගෙට නියමව
සිටියේය. සිරගෙදරදී පවා
ජෝසෙප් කීකරු විය, අන්‍යයන්ට
උපකාර කළේය. සිරගෙදර
ප්‍රධානියාට එහි කටයුතු
සංවිධානය කිරීමේදී
ජෝසෙප් කෙරෙහි
විශ්වාසය තැබීය.
දෙවියන්
වහන්සේ
ජෝසෙප්
සමඟ සිටි නිසා
සිරගෙදර, එහි සිටි
සියල්ලන්ට යහපත්
ස්ථානයක් විය.





රජතුමාගේ ගේ සාදන්නාද,
මිදියුස සාදන්නාද සිරගෙදර
සිටියෝය. “ඔබ දුකෙන් සිටින්නේ
මන්දැ” යි දිනක් ජෝසෙප් ඔවුන්ගෙන්
ඇසුවේය. “අප දුටු සිහින වල තේරුම්
කියාදීමට කිසිකෙනෙකු නැතැ” යි
සිතින් වද වෙමින් සිටි ඔවුහු කීවෝය. “දෙවියන් වහන්සේ ට පුළුවනි”

යි ජෝසෙප් කීවේය.
“මට ඒ සිහින කියන්න”.

“ඔබේ සිහිනයේ තේරුම නම් ඔබ තව දින තුනකින් නැවතත් ඵාරාවෝ රජතුමාගේ සේවයේ පිහිටවන බවයැ” යි ජෝසෙප් මිදියුස සාදන්නාට කීවේය. “එවිට මාවත් සිහිකරන්න. මාවද නිදහස් කරන ලෙස ඵාරාවෝ හට කියන්න” පූප සාදන්නා දුටු සිහිනයේ අර්ථය නම් නරක ආරංචියකි. “ඔබ දින තුනකින් මැරෙන්නේයැ” යි ජෝසෙප් ඔහුට පැවසීය. සිහින දෙකම සැබෑ විය.



නමුත් එක් දිනක් කැළඹුණු සිතින් යුක්තව
ඵාරාවෝ ඇහැරෙන තුරු මිදියුස සාදන්නා හට
ජෝසෙප් අමතක විය. “මම හීනයක් දුටුවායැ”
යි ඵාරාවෝ කෑගැසුවේය. ඔහු සමඟ
සිටි කිසිදු ප්‍රඥාවන්තයෙකුට
එහි තේරුම ඔහුට
පැහැදිලි කර
දෙන්නට





නොහැකි විය. එවිට
මිදියුස සාදන්නාට ජෝසෙප්
මතක් විය. ඔහු ඵාරාවෝ හට
ජෝසෙප් ගැන පැවසුවේය.

ඵාරාවෝ වහාම ජෝසෙප් ගෙන්වා ගත්තේය.
“ඔබේ හීනය දෙවියන් වහන්සේ දෙන
පණිවුඩයක්යැ” යි ජෝසෙප් රජතුමාට කීවේය.
“ඊජිප්තු දේශයට සරුසාර අවුරුදු හතක්ද ඉන්පසු අවුරුදු
හතක දරුණු සාගත කාලයක්ද පැමිණෙන්නේය”.



“දැන් සිටම සරුසාර අවුරුදු හත තුල ආහාර ගබඩා කරන්නට සැලසුම් කරන්නයැ” යි ජෝසෙප් ඵාරාවෝ හට අවවාද කළේය. “එසේ නැත්නම් ඔබේ ජනතාව සාගත කාලය තුල කුසගින්නේ මියයනු ඇත”. “දෙවියන් වහන්සේ ඔබ සමඟයැ” යි ඵාරාවෝ පැවසීය. “ඔබ ඊජිප්තු දේශය පාලනය කරන්නේය, ඔබ දෙවැනි වන්නේ මට පමණි”.



සරුසාර අවුරුදු හත පැමිණියේය. ඉන්පසු අවුරුදු හතක සාගතය විය. නුවණක්කාර ලෙස විශාල ලෙස ආහාර ගබඩා කර තැබූ ඊජිප්තු දේශය හැර අන් සෑම තැනකම ආහාර හිඟ විය. ඊජිප්තු දේශයට ඉතා දුරින් පිහිටි ජොසෙප්ගේ උපන්බිමේ ඔහුගේ පවුලේ අය සාගින්නෙන් පෙළුනෝය.



සෑම රටකම මිනිසුන් ධාන්‍ය මිලදී ගැනීමට ඊජිප්තුවට ගියෝය. “නුඹලාත් යා යුතුයැ” යි ජාකොබ් තම පුත්‍රයන්ට අණ කළේය. “ඒ නැත්නම් අපි සාගින්නෙන් මිය යාවියැ” යි ඔහු කීවේය.

ඊජිප්තුවට පැමිණි පුත්‍රයෝ ආහාර මිලදී ගන්නට සුදානම් වූවෝය.



ජාකොබ්ගේ පුත්රයෝ ඊජිප්තුව භාරව
සිටි ස්වාමියා ඉදිරියේ වැඳ වැටුණෝය.
ඔවුන් තම සහෝදරයා වූ ජෝසෙප්ව
හඳුනා ගත්තේ නැත. නමුත් ජෝසෙප්
ඔවුන්ව දැන සිටියේය. ජෝසෙප්ට ඔහුගේ
ළමා කාලයේ සිහින සිහිපත් විය. දෙවියන්
වහන්සේ ඔහුව ඔහුගේ සහෝදරයන්ට
වඩා උසස් කළ සේක.



ජෝසෙප් ඉතා ප්‍රඥාවන්ත කෙනෙකු වූයේය.
ඔහු සැරෙන් ඔවුන් අමතා ඔහුගේ සහෝදර
සිමියොන් ප්‍රාණඇපයට තබා ගත්තේය. “ආහාර
රැගෙන නිවසට ගොස් නැවත ඔබේ
බාලම සහෝදරයා සමඟ නැවත
එන්නයැ” යි ඔහු අණ කළේය.
“එවිට මම නුඹලා
ඔත්තුකරුවන්
නොවන
බව
දැනගනිමි”.



අවුරුදු ගණනාවකට පෙර
ජෝසෙප් ව වහල්කමට විකුණූ
නිසා දෙවියන් වහන්සේ ඔවුන්ට
දඬුවම් කරන්නේයැයි
සහෝදරයෝ සිතුවෝය.



ජාකොබ් සහ ඔහුගේ පුත්‍රයෝ ව්‍යාකූල වූහ. “ධාන්‍යවලට
අප ගෙවූ මුදල් ආපසු අපට ලැබුණේය. අප විසින්
බෙන්ජමින්ව රැගෙන ආ යුතු බව පාලකයා පැවසීය”
ජාකොබ් බෙන්ජමින්ට යන්නට නොදුන්නේය.
නමුත් ඉක්මනින්ම ආහාර අවසන් විය.
සහෝදරයන්ට නැවත ඊජිප්තුවට යාමට
සිදු විය. බෙන්ජමින් ඔවුන් සමඟ ගියේය.



ජෝසෙප් බෙන්ජමින් දුටුවිට මහා මංගල්‍යයක් සූදානම් කරන්නට ඔහුගේ සේවකයන්ට අණ කළේය. ඒ සඳහා සහෝදරයන්ට ආරාධනා ලැබුණි. “ඔබේ පියා ජීවතුන් අතරද? ඔහු සුවෙන්දැ?” යි ජෝසෙප් ඇසුවේය. සමහරවිට ඔහු තම පවුල එකට එකතු කරන්නේ කෙසේදැයි සිතුවා විය හැක.



එසේම අවුරුදු ගණනාවකට පෙර සහෝදරයන් විසින් සිදුකල පව් වලට ඔවුන් දැන් දුක් වෙනවාදැයි දැනගැනීමටත් ජෝසෙප්ට වුවමනා විය. භෝජන සංග්‍රයහට පසු ජෝසෙප් ඔවුන් සොරකම් කළ බවට චෝදනා කළේය. “ඔබට දඬුවමක් ලෙස බෙන්ජමින් මාගේ වහලෙක් ලෙස තබා ගන්නෙමි” යි ජෝසෙප්



කීවේය. “මාගේ ස්වාමිනි, ඔහු වෙනුවට මාගේ ජීවිතය ගනු මැනවියැ” යි ජුදා අයැද සිටියේය. ජෝසෙප් විකුණන්නට යෝජනා කළ ජුදා දැන් සැබවින්ම වෙනස් වී ඇති බව ඔහු දැනගත්තේය.



තවදුරටත් ඔහුගේ පවුල කෙරෙහි ඇති ආදරය සඟවන්නට නොහැකි වූ ජෝසෙප් සියලුම ඊජිප්තු ජාතිකයින් එතැනින් පිට කළේය. ඉන්පසු ඔහු හැඬුවේය. “මම, නුඹලා විසින් ඊජිප්තුවට විකුණූ ඔබේ සහෝදර ජෝසෙප් වෙමි” පුදුමයටත් බයටත් පත්වූ සහෝදරයෝ කිසිවක් නොකීවෝය.



ජෝසෙප් ඔහුගේ සහෝදරයන් දිරිමත්
කළේය. “නුඹ සියලු දෙනාගේ
ජීවිත මේ
සාගතයෙන්
ගළවාගන්නා පිණිස
දෙවියන් වහන්සේ මා
ඊජිප්තුවේ ස්වාමියා
කළසේක. යන්න, මාගේ
පියා මා වෙත ගෙනෙන්න.
මම ඔබ රැකබලා ගන්නම්”.



ජාකොබ් සහ
ජෝසෙප් නැවතත්
ඊජිප්තුවේදී එකතු වූහ. මුළු
පවුලම එහි සාමයෙන් සහ
සශ්‍රීකත්වයෙන් ජීවත් වූහ.

# දෙවියන් වහන්සේ ජෝසෙප් නම් වහලා උසස් කරන සේක

## දේව වචනයෙන් එක් කථාවක්

## බයිබලයේ

උත්පත්ති 39-45

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)